ජනසමාජයේ චින්තනය හැඩගැස්වීමට භාෂාවකට ප්‍රබල හැකියාවක් ඇති බව ඒ පිළිබඳව කෙරෙනා පුළුල් සංවාදයන් ඔස්සේ ඉස්මතු වන කරුණකි. එනිසා, තමන් යොදාගන්නා භාෂාව සම්බන්ධයෙන් මාධ්‍ය මගින්ද සවිඥාණික සහ ප්‍රවේසම් සහගත ප්‍රවේශයක් ගත යුතු වේ. වෙනත් බොහෝ මාධ්‍ය තුළ භාවිතා වන භාෂාවට අදාළ වන කරුණු අතර, ආබාධ සහිත ප්‍රජාව සම්බන්ධයෙන් කරුණු දැක්වීමේදී යොදාගන්නා භාෂාවද වේ.

උදාහරණයක් ලෙසින් මෙම ලංකාදීප ප්‍රවෘත්තිය දැක්විය හැක. මෙහිදී හෙරොයින් ජාවාරමක් සම්බන්ධව සැකපිට අත්අඩංගුවට ගත් පුද්ගලයෙකු ගැන කියැවේ. මෙහිදී එම තැනැත්තාට ආබාධයක් සහිත බව පුවතට අදාළ විය හැක. එනමුත් එය සඳහන් කරනා ආකාරය සම්බන්ධයෙන් පුවත්පත වඩාත් ප්‍රවේසම් සහගත විය යුතුව තිබිණි. උදාහරණ ලෙසින් ගන්නේ නම් "ආබාධිතයා එක්ක 7 ක් අත්අඩංගුවට" යන උප-සිරස්තලය ඔස්සේ එම පුද්ගලයාගේ ආබාධිත බව පිළිබඳව ඍණාත්මක දැක්වීමක් සිදු නොවන්නේද?

එසේම ආබාධ සහිත වූවන්ව හැඳින්වීමේදී ආබාධය නොව පුද්ගලයාව මුල් කොට ගත් භාෂාවක් (Person-first language) යොදාගැනීම වඩාත් යෝග්‍ය බව දැන් පිළිගැනෙන බවත් මෙසේම දක්වමු. එසේ ගත් විට 'ආබාධිත' යන යෙදුම වෙනුවට 'ආබාධ සහිත' වැනි යෙදුමක් යෝග්‍ය නොවන්නේද? එසේ නැතිනම් පුද්ගලයාව මුල් කොට ගත් භාෂාවට අනුව එසේ භාවිතා කළ හැකි වෙනත් යෙදුමක් ඔබට යෝජනා කළ හැකිද?

**#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa**

See Less